# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 සැප්තැම්බර් මස 25 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2020.09.25 දින නිකුත් කරන ලදී)**

## විවාහවීමේ අවම වයස

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකාවේ විවාහවීමේ අවම වයස හඳුන්වාදීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විවාහවීමේ අවම වයස

## ශ්‍රී ලංකාවේ විවාහවීමේ අවම වයස හඳුන්වාදීම සඳහා වූ පනතකි

පූර්විකාව.

ළමයකුගේ හෝ අඩු වයසින් සිදුකරන විවාහය තරුණ තැනැත්තකුගේ අධ්‍යාපනය, සංවර්ධනය සහ ආරක්ෂාව වෙත අයිතිය උල්ලංඝනය කිරීමක් සහ ඒ හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ ළමුන් ලිංගික අපයෝජනය ඇතුළුව ශාරීරික හෝ මානසික ප්‍රචණ්ඩත්වයේ ආකාරයන්ට, හිංසාවට සහ අපයෝජනයට, නොතකා හැරීමට හෝ නොසැළකිලිමත් ලෙස සැළකීමට හෝ සූරාකෑමට ලක්කිරීමේ අවදානමට පත් කිරීමට ඉඩ ඇති සමාජීය දුසිරිතක් වන හෙයින් ද:

වයස, ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් එවැනි ඕනෑම කරුණක් නොතකා සියලු දෙනාම සඳහා සමාන ආරක්ෂාව ශ්‍රී ලංකාව සහතික කර ඇති හෙයින් ද:

වඩා යහපත් සහ වඩා සමෘද්ධිමත් සමාජයක් බවට පත්වීම පිණිස අනාගත පරම්පරාවන්ට ඉගෙනීමට, සංවර්ධනයට සහ වර්ධනයට අවස්ථා ඇති බව සහතික කරනු වස් එම අනාගත පරම්පරාවන් වෙත රාජ්‍යය බැඳී සිටින හෙයින් ද; සහ

වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන්ට නීතියේ හැකි සියලු ආරක්ෂාවන් සලසා ඔවුන් විවාහයකට එළඹීමට සැලැස්වීම සඳහා කිසිදු තැනැත්තකු ඔවුන් වෙනුවෙන් කැමැත්ත පළ කිරීම හෝ තීරණය කිරීම නොකළ යුතු බව සහතික කිරීම පිණිස සහ මෙම පනතේ සාරය සහ අත්‍යර්ථයට පූර්ණ බලාත්මක කරනු පිණිස රාජ්‍යයේ අදාළ ආයතන සඳහා ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ එමගින් ළමා විවාහ තුරන් කරලීම පිණිස රජය කැපව සිටින බව දන්වා සිටින හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක    දරන විවාහවීමේ අවම වයස පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අවම වයස අවුරුදු දහඅට බව.

**2.** මෙම පනත බලාත්මක වීමෙන් අනතුරුව සිදු කරනු ලබන කිසිදු විවාහයක් එකී විවාහයට අදාළ පාර්ශ්ව දෙකම වයස අවුරුදු දහඅට සම්පූර්ණ කරනු ලැබ නොමැති නම් වලංගු නොවිය යුතු ය.

ළමයකු වූ විවාහගත පාර්ශ්වයේ මනාපය පරිදි ළමා විවාහ අවංගු කළ හැකි බව.

3. (i) සෑම ළමා විවාහයක්ම, එකී විවාහය සිදු කරන ලද්දේ මෙකී පනත ක්‍රියාත්මකවීමට පෙර හෝ පසුව වුව ද, එකී විවාහය සිදු කරනු ලබන අවස්ථාවේ දී ළමයකු වූ විවාහගත පාර්ශ්වයේ මනාපය පරිදි අවලංගු කළ හැකි විය යුතු ය;

(ii) එසේ වුව ද, අහෝසි කිරීමේ නියෝගයක් මඟින් ළමා විවාහයක් අවලංගු කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක්, එකී අයදුම්කරු ජීවත්වන ප්‍රදේශයේ අධිකරණ බල සීමාව තුළ පිහිටි දිස්ත්‍රික් අධිකරණය තුළ ගොනුකළ හැකි අතර, විවාහය සිදුවන අවස්ථාවේ දී ළමයකු වූ විවාහගත පාර්ශ්වයක් විසින් පමණක් එකී අයදුම්පත්‍රය ගොනුකළ හැකි ය;

(iii) අයදුම්පත්‍රය ගොනු කරන අවස්ථාවේ දී අයදුම්කරු බාල වයස්කරුවෙක් නම්, එකී අයදුම්පත්‍රය තම භාරකරු හෝ නඩු සහයක මාර්ගයෙන් ගොනුකළ හැකි ය;

(iv) මෙම වගන්තිය යටතේ ඕනෑම අවස්ථාවක එකී අයදුම්පත්‍රය ගොනුකළ හැකි ය. එසේ වුව ද, අයදුම්පත්‍රය ගොනුකරනු ලබන ළමයා වයෝ පූර්ණත්වය ලැබීමට අවුරුදු 2කට කලින් එකී අයදුම්පත්‍රය ගොනුකළ යුතු ය;

(v) මෙම වගන්තිය යටතේ ගොනුකරනු ලබන සෑම අයදුම් පත්‍රයක්ම ලිඛිත විය යුතු අතර, අයදුම්කරු හෝ ඔහු වෙනුවට අයදුම්පත්‍රය සකස් කරනු ලබන තැනැත්තා විසින් අත්සන් කරනු ලැබ තිබිය යුතු අතර, ඒ කිසිදු මුද්දර ගාස්තුවකට යටත් නොවිය යුතු ය. වගඋත්තරකරුවකු හෝ සාක්ෂිකරුවකු වෙත යවනු ලබන සෑම සිතාසියක්ම මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය;

(vi) අයදුම්පත්‍රය ගොනු කරනු ලද පසුව එකී අයදුම්පත්‍රය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව අධිකරණය සෑහීමකට පත්වේ නම් එකී විවාහය පිළිබඳව අහෝසි කිරීමේ නියෝගයක් එකී අධිකරණය විසින් ලබාදිය යුතු ය:—

(අ) විවාහය ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ දී අයදුම්කරු වයස අවුරුදු 18 ට එළඹ නොතිබූ බව; සහ

(ආ) විවාහය ලියාපදිංචි කරන ලද බව.

(vii) මෙම වගන්තිය යටතේ ශූන්‍යතා නියෝගයක් ලබාදීමේ දී, විවාහය සිදුකරනු ලබන අවස්ථාවේ දී තමන් හට අවස්ථාවෝචිත පරිදි අනෙක් පාර්ශ්වය වෙතින් ලැබුණු මුදල්, වටිනා භාණ්ඩ, ආභරණ සහ අනික් ත්‍යාග හෝ එකී වටිනා භාණ්ඩ, ආභරණ, වෙනත් ත්‍යාග සහ මුදල්වලට සමාන මුදලක් එකී පාර්ශ්වය, ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් හෝ භාරකරුවන් වෙත ආපසු ලබාදෙන ලෙස විවාහයෙහි පාර්ශ්ව දෙකටම සහ ඔවුන්ගේ දෙමාපියන් සහ භාරකරුවන් වෙත විධාන කරමින් අධිකරණය විසින් නියෝගයක් ලබාදිය යුතු ය:

එසේ වුව ද, අධිකරණය ඉදිරියේ පෙනී සිට එකී නියෝගය ලබා නොදිය යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශ්වයන් වෙත නොතීසි නිකුත් කරනු ලැබ නොමැති නම් එවැනි කිසිදු නියෝගයක් ක්‍රියාත්මක නොකළ යුතු ය;

(viii) ළමා විවාහය කරණ කොට ගෙන දරුවන් බිහිවී ඇති අවස්ථාවක දී, එකී දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධයෙන් අධිකරණය විසින් සුදුසු නියෝගයක් ලබාදිය යුතු ය. මෙම වගන්තිය යටතේ දරුවකුගේ භාරකාරිත්වය සම්බන්ධයෙන් නියෝගයක් ලබාදීමේ දී, දරුවාගේ සුභසාධනය සහ උපරිම සුභසිද්ධිය කෙරෙහි අධිකරණය විසින් ප්‍රමුඛතාව සැළකිල්ල යොමු කළ යුතු ය;

(ix) ළමයකුගේ භාරකාරත්වය පිළිබඳ නියෝගයකට, ළමයාගේ අයිතිවාසිකම් සුරැකෙන පරිද්දෙන් ළමයා වෙත අනෙක් පාර්ශ්වයට ලබා දෙන ප්‍රවේශය පිළිබඳ සුදුසු නියෝග ඇතුළත් කළ හැකි අතර, එවැනි වෙනත් නියෝග ළමයාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සුදුසු වන බව අධිකරණ මගින් තීරණය කළ යුතු ය.

(x) එමෙන්ම, අධිකරණය මගින් විවාහයක පාර්ශ්වකරුවකුට, ඔවුන්ගේ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට ළමයාගේ නඩත්තුව පිළිබඳ සුදුසු නියෝගයන් කරනු ලැබිය හැක්කේ ය.

ළමා විවාහයන්ගෙන් උපන් දරුවන්ගේ නීත්‍යානුකූල භාවය.

4. 3 වන වගන්තිය යටතේ වන විවාහ ශූන්‍යතා නියෝගයකින් ළදරු විවාහයක් අවසන් වීමක් නොසලකා, නියෝගය නිකුත් කිරීමට පෙර උපත ලද හෝ පිළිසිඳ ගත් සෑම ළදරුවෙකුම, මෙම පනත ක්‍රියාත්මක වීමට පෙර හෝ ක්‍රියාත්මක වීමෙන් පසුව උපත ලද්දේ වුව ද, සියලු කාර්යයන් සඳහා සුජාත දරුවකු වන්නේ ය.

**5.** මෙම පනතේ —

අර්ථ නිරූපණය.

(අ) "ළමයා" යන්නෙන්, අවුරුදු දහ අට සපුරා නොමැති ඕනෑම තැනැත්තකු අදහස් වේ;

(ආ) "ළමා විවාහය" යන්නෙන්, විවාහයේ පාර්ශ්ව දෙකින් කවරක් හෝ ළමයෙකු වීම අදහස් වේ;

(ඇ) "විවාහය" යන්නෙන්, සංශෝධිත පරිදි 1952 අංක 44 දරන උඩරට විවාහ සහ දික්කසාද නීතිය යටතේ හෝ ඒ මගින් සිදුකරන ලබන විවාහ සහ ඉස්ලාම් ආගම අදහන තැනැත්තන් අතර සිදුකරනු ලබන විවාහ ඇතුළුව ඕනෑම විවාහයක් අදහස් වේ;

(ඈ) "රෙජිස්ට්‍රාර්" යන්නෙන්, විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත, උඩරට විවාහ සහ දික්කසාද පනත සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව පත්කරනු ලැබූ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු හෝ ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරයකු අදහස් වේ.

**6.** මෙම වගන්තිය යටතේ කවුරුන් හෝ වරදක් කරන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ සාරාංශ නඩු විභාගයකින් පසුව දඬුවම් නියම කොට දඩ නියම කරනු ලැබේ:—

දඬුවම්.

(i) ළමා විවාහයක් සිදුකරන, පවත්වන, ඊට උපදෙස් දෙන හෝ ඊට අනුබල දෙන යම් තැනැත්තකු, එම විවාහය ළමා විවාහයක් නොවේ යැයි විශ්වාස කිරීමට තමන්ට හේතු පැවති බවට ඔප්පු කිරීමට සමත් වන්නේ නම් හැර, වසර දෙකක් දක්වා වන බරපතල සිර දඬුවම් සහ රුපියල් එක්දහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය;

(ii) ළමයකු ළමා විවාහයකට එළඹෙන අවස්ථාවක දී, ළමයාගේ දෙමව්පියන්, භාරකරුවන්, වෙනත් පුද්ගලයන් හෝ නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන වෙනස් ආකාරයක ධාරිතාවක තැනැත්තන් ද ඇතුළත්ව භාරකාරත්වය දරන

යම් පුද්ගලයකු, ළමා විවාහ ප්‍රවර්ධනයට හෝ එම විවාහය චාරිත්‍රානුකූලව සිදුකිරීමට අවසර දෙන යම් කාර්යයක නියැළෙන, ළමා විවාහ උත්සවයකට සහභාගීවීම ද ඇතුළුව විවාහ සිදුකිරීම වැළැක්වීමට නොසැළකිලිමත් ලෙස අසමත්වන යම් සංවිධානයක හෝ සංගමයක සාමාජිකයකු වසර දෙකක් දක්වා වන බරපතල සිරදඬුවම් සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය;

(iii) යම් තැනැත්තකු දෙපාර්ශ්වය වයස දහඅට සපුරා නොමැති අවස්ථාවක, එම පාර්ශ්වයන් වයස දහඅට සපුරා ඇති බවට අදාළ විවාහ රෙජිස්ට්‍රාර්වරයාට දැනුවත්ව හෝ හිතාමතාම සාවද්‍ය ප්‍රකාශයක් කරන්නේ නම්, වසරක කාලයක් නොඉක්මවන සිරදඬුවමකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු වන අතර, රුපියල් පනස්දහසක දඩයකට හෝ ඒ දඬුවම් දෙකට ම යටත් කළ යුතු ය.

මෙම නීතියේ ප්‍රතිපාදන වෙනත් යම් ලිඛිත නීතියක ප්‍රතිපාදන ඉක්මවා බලාත්මක වන බව.

7. මෙම නීතියේ ප්‍රතිපාදන වෙනත් යම් ලිඛිත නීතියක ප්‍රතිපාදන ඉක්මවා බලාත්මක වන අතර, මෙම පනතේ ප්‍රතිපාදන හා වෙනත් යම් නීතියක ප්‍රතිපාදන අතර, ගැටුමක් හෝ යම් අනනුකූලභාවයක් ඇති විටක වෙනත් යම් නීතියක ප්‍රතිපාදන ඉක්මවා මෙම නීතියෙහි ප්‍රතිපාදන බලපැවැත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.